යුක්තිය පරදවා බහුතරය ජයගත්තා

-ජනාධිපති නීතිඥ, විජේදාස රාජපක්ෂ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති

දෝෂාභියෝගයට එරෙහිව හඬ නැගුවන් අතර ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඉදිරියෙන්ම සිටියේය. දෝෂාභියෝග ක්‍රියාදාමය ඉදිරියට යද්දී නීතිඥ සංගමය ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමට විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීය. දෝෂාභියෝග විශේෂ තේරීම් කාරක සභාව ඉදිරියේ අගවිනිසුරුවරියට සාධාරණ නඩු විභාගයකට අවස්ථාවක් නොලැබෙන්නේ නම්, ඊට විරෝධය විරෝධය පා ක්‍රියා මාර්ග කීපයක් ගැනීමට එහිදී තීරණය විය.

එහෙත්, ජනාධිපතිවරයා අගවිනිසුරු-වරිය ධුරයෙන් ඉවත් කර, නව අගවිනිසුරුවරයකු පත්කිරීමෙන් පසු දක්නට ලැබුණේ නීතිඥ සංගමය එතෙක් දෝෂාභියෝගය සම්බන්ධයෙන් දැක්වූ උනන්දුව පහව ගිය සෙයකි. නව අගවිනිසුරුවරකු පත්කිරීමෙන් පසු නීතිඥ සංගමයේ නිලධාරීන් අරලිය ගහ මැදුරේදී ජනාධිපතිවරයා මුණගැසීමත්, නව අගවිනිසුරු රාජකාරි බාරගන්නා අවස්ථාවේ, ඔහුට ජයඝෝෂා පවත්වන්නට අලුත් කඩේ උපරිමාධිකරණය අසළට රැස්ව සිටි ගුණසිංහ පුර, පිට කොටුව, මරදාන අවට ස්වයං රැකියාකරුවන් නීතිඥ සංගමයේ සභාපතිවරයාට ද ජයඝෝෂා පැවැත්වීමත් මාධ්‍ය වාර්තා කළේ ඒ අතරය.

නීතිඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ සමග 'සන්නස' මේ සාකච්ඡාව කළේ දෝෂාභියෝගයේ 'උණුසුම' පහව යාමෙන් ඉක්බිතිවය.

දෝෂාභියෝගය ඉදිරියට යන අවස්ථාවේදී නීතිඥ සංගමයෙන් ඊට විරුද්ධව මතු වූ ප්‍රතිවිරෝධතාව, අගවිනිසුරුවරිය ධුරයෙන් ඉවත් කිරීම සහ නව අගවිනිසුරුවරයකු පත්කිරීමත් සමග සමනය වූ බවක් ජේනවා. ඇයි ඒ?

අගවිනිසුරුවරියට විරුද්ධව දෝෂාභියෝගයක් ගේන්න කලින් අධිකරණ ස්වාධීනත්වයට දැඩිව බලපාන සිදුවීම් ගණනාවක්ම රට තුළ සිදුවුණා. 2012 ජූලි මාසේ 19 වෙනිදා මන්නාරම අධිකරණයට ගල් ගැහුවා, ඒකේ දේපොළවලට ගිනි තිබ්බා, ඊට දින කීපයකට කලින් එගි විනිසුරුවරයාට තර්ජණය කළා. ඊට පස්සේ ඔක්තෝබර් මාසයේදී අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාට පහරදීමක් සිදුවුණා. ඊළඟට තමයි අගවිනිසුරුවරියට විරුද්ධව දෝෂාභියෝගයක් ගේන්නේ. මේ විදිහට අධිකරණයේ ස්වාධීනත්වයට විරුද්ධව රැල්ලට කරදර එන කාලයක් බවට පසුගිය කාලය පත්වෙලා තිබුණා. දෝෂාභියෝගයේදී නීතිඥ සංගමය වගේම, රටේ උගත්, වැදගත් ව්‍යක්තීන් නියෝජනය කරන අයත් එක්ව අගවිනිසුරුතුමියට වන අසාධාරණය වළක්වන්න සටනක් කළා. නමුත් අවාසනාවකට අනෙකුත් දේවල් වගේම, ලංකාවේ තියෙන්නේ යුක්තිය ජයගන්නවා වෙනුවට බහුතරය ජයගන්නා ක්‍රමයක් නිසා ඒ අනුව යුක්තිය පරදවා බහුතරය ජයගත්තා. ඉන් එහාට අපිට වෙන කළ හැකි දෙයක් නෑ.

දෝෂාභියෝගයේදී නීතිඥ සංගමය ඥාති ස්ථාවරයන් අගවිනිසුරුවරිය ඉවත් කිරීමත් සමග වෙනස්වුණාද?

2012 දෙසැම්බර් 15 වෙනිදා නීතිඥ සංගමයේ විශේෂ මහ සභා රැස්වීමක් කැඳෙව්වා. ඒකෙදි අපි ඒකමතිකව තීරණයක් ගත්තා ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට සාදාරණ නඩු විභාගයක් දෙන්නේ නැතුව, එතුමිය ධුරයෙන් ඉවත් කළොත්, ඊළඟට එන අගවිනිසුරු කවුරු වුණත්, අපි ඔහු හෝ ඇය නිල පිළිගැනීමේ උත්සවයක් තියලා පිළිගන්නේ නෑ කියලා. ඒ අනුව ජනවාරි 23වෙනිදා තිබුණ නව අගවිනිසුරු පිළිගැනීමේ නිල උත්සවය නීතිඥ සංගමය වර්ජණය කළා. ඉදිරියටත් අපිට සංගමයක් වශයෙන් ගතහැකි යම් ක්‍රියාමාර්ගයක් තියනවා නම් අපි ඒ ක්‍රියාමාර්ග ගන්නවා. සංගමයේ ස්ථාවරයේ වෙනසක් වෙලා නෑ.

නීතිඥ සංගමයේ විශේෂ මහ සභාවේ ගත්ත තීරණ, සියළු දෙනාගේ එකඟත්වයෙන් ගත් තීරණ නොවෙන බව සංගමයේ ඇතැම් නීතිඥවරු පසුව යම් යම් අවස්ථාවල ප්‍රකාශ කළා නේද?

ඒක සම්පූර්ණ බොරු කතාවක්. එදා මහා සභා රැස්වීමට පවා, දෝෂාභියෝගයට අස්සන් කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් සහභාගිවුණා. ලලිත් දිසානායක, මොහාන් සිල්වා සහ ලක්ෂ්මන් වසන්ත පෙරේරා. ඒ තුන්දෙනත් මේ යෝජනාවලට පක්ෂව මහ සභාවෙදි අත ඉස්සුවා. ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමයේ සභාපති මෙන්ඩිස්, ලේකම් පද්මසේකර දෙදෙනාත් ඉස්සරහ පේලියේ ඉඳගෙන, යෝජනාවලට පක්ෂව අත ඉස්සුවා. ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්, සේපාල රත්නායකත්, එතනම ඉන්න අනෙක් ලේකම්, සුමිත් විජේසිංහත් මේ යෝජනාවලට පක්ෂව අත ඉස්සුවා. ඒ අයම තමයි ඉතිං පස්සේ ගිගිල්ලා මේක ඒකමතික තීරණයක් නෙවෙයි කියන කතාව තැන් තැන්වල කිව්වෙත්. ආණ්ඩුවට වෙන අවමානය වහගන්න රාජ්‍ය මාධ්‍ය පාවිච්චි කරලා මටත්, අනෙකුත් නිලධාරීන්ටත්, නීතිඥ සංගමයටත් කැළලක් ඇති කරන්න දරපු උත්සාහයක් කියලා තමයි ඒ ගැන කියන්න වෙන්නේ.

නීතිඥ ප්‍රජාවේ විරෝධතා තුළ ක්‍රියාත්මක වුණේ ඩොලර්වලින් යැපෙන එන්.පී.ඕ. නීතිඥයන් සුළු පිරිසකගේ වැඩසටහනක් කියා චෝදනාවකුත් ආණ්ඩුවෙන් එල්ල වුණා නේද?.

ආණ්ඩුවෙන් එහෙම මතවාදයක් හදන්න හැදුවා. ආණ්ඩුව ගොබෙල්ස් කියරි එකෙන් එහෙම මතවාදයක් ගොඩනගන්න උත්සාහ කළා. නමුත් නීතිඥ සංගමයට එවැනි චෝදනාවක් ඉදිරිපත් වෙලා නෑ. නීතිඥ සංගමයට එහෙම ඇඟිල්ල දික්කරන්න තරම් හයියක් ආණ්ඩුවට නෑ. ආණ්ඩුව දන්නවා නීතිඥ සංගමය කවුද කරන්නේ කියලා. නමුත් සමහර නීතිඥයන්ගේ නම් ගම් වශයෙන් දක්වලා එහෙම චෝදනා කරලා තියනවා. එහෙම චෝදනා කරනවනම් ආණ්ඩුවට යුතුකමක් තියනවා ඒවා හෙළිදරව් කරන්න. එහෙම නැත්නම් අපිට පිළිගන්න වෙන්නේ ආණ්ඩුව පුරුදු පරිදිම, ඒ අයගේ සම්ප්‍රදායානුකූලව අන් අයට මඩ ගැසීමේ කටයුත්තක යෙදුනා කියලයි.

නව අගවිනිසුරු පත් කිරීමෙන් පසු ජනාධිපතිවරයා සහ නීතිඥ සංගමයේ නිලධාරීන් අතර හමුවක් අරලිය ගහ මන්දිරයේදි සිදුවුණා. එය සිදුවුණේ නීතිඥ සංගමයේ ඉල්ලීමක් අනුවද? නීතිඥ සංගමය නොවෙයි, සංගමයේ විධායක සභාව ගිහිල්ලා අරලිය ගහ මන්දිරයේදී ජනාධිපති මුණගැහුණා. අපි ජනවාරි දොලොස්වෙනිදා සෙන-සුරාදා ජනාධිපතිතුමා හමුවෙන්න ඉල්ලීමක් කළා. අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලුවේ ශිරාණි බණ්ඩාරනායක මැතිණිය ඉවත් කරන්නට කලින් ඒ

> සාකච්ඡා කළේ
> **ශ්‍රීලාල් සෙනෙවිරත්න**

ගැන කතාකරන්න අවස්ථාවක් දෙන්න කියලයි. නමුත් ජනාධිපතිවරයා අපිට අවස්ථාවක් දුන්නේ එතුමිය ධුරයෙන් ඉවත් කිරීමෙන් පසුවයි. 13වෙනිදා එතුමිය ධුරයෙන් ඉවත් කරළා, 14 වෙනිදා අපිට ජනාධිපතිතුමා හමුවෙන්න අවස්ථාවක් දුන්නා.

නීතිඥ සංගමය ජනාධිපතිවරයා හමුවීමට අවස්ථාවක් ඉල්ලීමෙන් මොකක්ද බලාපොරොත්තු වුණේ?

මුල් අවස්ථාවේදි අපි ඉල්ලන්න බලාපොරොත්තු වුණේ අගවිනිසුරුතුමියට සාධාරණ නඩු විභාගයක් සඳහා අවස්ථාවක් දෙන්න කියලයි. පාර්ලිමේන්තුවේ දෝෂාභියෝග යෝජනාව අනුමත වුණත්, ඒ වහාම අගවිනිසුරු ඉවත් කළ යුතුයි කියලා නීතියක් නෑනේ. අනික පාර්ලිමේන්තුවට වුණත් ඒ සම්බන්ධව සාධාරණ පියවරක් ගැනීමට හැකිවන පරිදි, මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තියනවා පුද්ගලික මන්ත්‍රී යෝජනාවක්. ඒක පදනම් කරගෙන තියෙන්නේ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් සියල්ල එකඟවෙලා තියන ලැටිමර් හවුස් මූලධර්මය අනුව. අපි කියන්න ගියේ ඒ පනත සම්මත කරගෙන හරි එතුමියගේ තීන්දුව පිළිබඳ විවිධ එකක්, විනිශ්චයකාරවරු තුන්දෙනෙකුට දාලා කරන්නය කියලා. නමුත් ඊට කලින් ජනාධිපතිවරයා අගවිනිසුරුවරිය ධුරයෙන් ඉවත් කරලා තිබුණා.

ඒ වගේ පසුවීමක ජනාධිපතිවරයා හමුවීමට ගිහිල්ලා විධායක කමිටුව මොනවද කතා කළේ?

ඔක තමයි එතදින් අපි කිව්වේ. නමුත් ජනාධිපතිතුමා ඒ පැත්තේ සාදාරණ බව කියන්න ගොඩක් කතා කළා. මම සුළු වෙලාවක් ඉඳළා ඒ සාකච්ඡාවෙන් නැගිටලා ආවා.

නව අගවිනිසුරුවරයාගේ පත්වීමට විරෝධය දක්වන ඇතැම් ජ්‍යෙෂ්ඨ නීතිඥවරු, ඔහු ඉදිරියේ විභාග වන නඩුවලට පෙනී නොසිටින්න තීරණය කර තිබෙනවා. නීතිඥ සංගමයේ විරෝධතාවය දක්-වන්න යම් පොදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්ද?

නීතිඥ සංගමයට එවැනි පියවරකට යන්න අයිතියක් නෑ. නීතිඥ සංගමය කියන්නේ විධායකයෙන් හෝ ව්‍යවස්ථාදායකයෙන් හෝ පැන-වෙච්ච බලයක් තියන ආයතනයක් නෙවෙයි. ස්වේච්ඡා සංවිධානයක්. ව්‍යක්තීය සාමාජිකයන් ගේ සුබ සිද්ධිය වෙනුවෙන් තමයි මූලිකවම අපි මේක හදාගෙන තියෙන්නේ. නමුත් පසුගිය කාලයේ අපි රට සහ අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙනුත් අපිට හැකියාව ඇති ආකාරයෙන් සටන් කළා.

මින් ඉදිරියට, නීතිඥ සංගමය මේ සම්බන්ධයෙන් යමක් කරන්නේ නෑ කියන එකද ඒකෙන් අදහස් වෙන්නේ?

නීතිඥ සංගමය විදිහට තවදුරටත් ඉදිරි වැඩ පිළිවෙළක් අපිට නෑ. මොකද ජනතාවගේ නඩු. ඒවාට පෙනී සිටින්න බාර අරන් තියන නීතිඥයන්ට අපිට කියන්න බෑ නඩුවලට පෙනී නොසිටින්න කියලා. එහෙම වුණොත් සේවාදායකයන්ට පුළුවන් නීතිඥයන්ට විරුද්ධව පියවර ගන්න. රටේ තියන ක්‍රමවේදය තුළ කරන්න පුළුවන් උපරිම දේවල් අපි කළා. වෙන කරන්න දෙයක් නෑ.

දෝෂාභියෝගය මගින් දේශපාලනයේ ඇති කළ බරපතල විකෘතියක් සමග කාලයක් ඉදිරියට ගියොත් ඉන් ඇතිවන ප්‍රතිඵල ආපසු හැරවීමට ඇති හැකියාව නැතිවී යනවා නේද? එහෙම වෙන්න

36 වන පිටට

> *මොළේ තියන අයට තේරෙනවානේ ක්‍රමවේදයක් නැතුව චෝදනා හරිද වැරදිද කියලා කවුද, කොහොමද තීරණය කරන්නේ කියලා. මේ රටේ පොල් ගෙඩියක් හොරකම් කරපු මිනිහෙක්ගේ නඩුවක්වත් අහන්න පුළුවන්ද මහේන්ද්‍රාන් කෙනෙකුගේ මට්ටමට අඩු සුදුසුකම් තියන කෙනෙකුට. මේ රටේ සාමදාන විනිශ්චයකාරකම දෙන්න නහනම්, උසස් පෙළ විභාගය සමත් නැති අයට. නමුත් අගවිනිසුරුතුමියගේ නඩු අහන්න පුළුවන් අට පාස් නැති අයට. ඒක නිසා තමයි අපි කියන්නේ ක්‍රමවේදයක් හදන්න.*